*සැ. යු.* - 2023.06.16 දින පළ කරන ලද අංක 2337 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,338 - 2023 ජුනි මස 23 වැනි සිකුරාදා - 2023.06.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | -- |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | -- |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 710 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | -- |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


*සැ. යු.* - ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජුනි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජූලි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජුනි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට අයත් දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙ හි, සේවයේ නියුතු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *සුදුසුකම්.-*

i. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) නිලධාරියෙක් විය යුතුයි.
ii. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූල ව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුයි.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ (කෘෂි සංවර්ධන ධාරාවට අයත්) අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියක් අනුව ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙ හි පළ කර ඇත.)

***සටහන*** **:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත්, අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

03. *අයදුම්පත් ඉදිරිපත් කිරීම.-*

සියලුම අයදුම්පත් විධිමත් ව හා නිවැරදි ව සම්පූර්ණ කර **2023.07.14 වැනි දින** හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයැදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.) "**ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**මධ්‍යම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම**" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයැදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයදුම්පත්‍රය www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකි ය.)

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2023 ජුනි මස 19 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ**

**ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමග නම :...................................................................................................................................... මයා/මිය/මෙනෙවිය

02. i. දැනට දරන තනතුර :...................................................................................................................................
ii. සේවය හා ශ්‍රේණිය :...................................................................................................................................
iii. දැනට සේවය කරන ආයතනය හා ලිපිනය :.......................................................................................................

03. පෞද්ගලික ලිපිනය :.......................................................................................................................................

04. ස්ත්‍රී/පුරුෂ භාවය :...........................................................................

05. i. උපන් දිනය :............................................................................
ii. 2023.07.14 දිනට වයස :.....................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :...........................................................

07. දුරකථන අංකය :..............................................................................

i. පෞද්ගලික :....................................... ii. රාජකාරි :.......................................

08. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියට උසස් වූ දිනය :......................................................................

09. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය තුළ ලබා ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර

| *සිට* | *දක්වා* | *අවුරුදු* | *මාස* | *දින* |
|---|---|---|---|---|
| .......................... | .......................... | ................ | ................ | ................ |
| .......................... | .......................... | ................ | ................ | ................ |
| .......................... | .......................... | ................ | ................ | ................ |

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2023.07.14) I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය : අවුරුදු :......... මාස :............. දින :.............

11. රාජ්‍ය සේවයේ මුල් පත්වීමේ සිට 2023.07.14 දින දක්වා සේවා කාලයට අදාළ විස්තර :

| *දරන ලද තනතුර* | *අයත් සේවාව* | *ආයතනය* | *කාලය* | |
|---|---|---|---|---|
| | | | *සිට* | *දක්වා* |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට දක්වන ලද ''කුසලතාවය'' පිළිබඳ විස්තර.-

i. වාර්ෂික කාර්යය සාධන ඇගයුම

(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි B. I ඡේදයේ සඳහන් පරිදි)

සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති කාර්යය සාධන මට්ටම පිළිබඳ විස්තර.-
(අදාළ නොවන වචන කපා හරින්න.)

| *වර්ෂය* | *ලබා ඇති කාර්යය සාධන මට්ටම* |
|---|---|
| 2018 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටුදායක |
| 2019 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටදායක |
| 2020 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටදායක |
| 2021 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටදායක |
| 2022 | විශිෂ්ඨ/සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ/සතුටදායක |

ii. ප්‍රකාශන.-

(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන් හි B. ii ඡේදයේ ප්‍රකාශන (a), (b) ලෙස කාණ්ඩගත කර ඇත.)

| *පළ කරන ලද ප්‍රකාශනය* | *අදාළ කාණ්ඩය* |
|---|---|
| | |

iii. ප්‍රශංසා හා සම්මාන.-

*(අ)* ලබා ඇති ප්‍රශංසා පිළිබඳ විස්තර -
(''පොදු 230බී'' ආකෘතිය මඟින් ලබා දී ඇති ප්‍රශංසා සඳහා පමණක් මේ යටතේ ලකුණු ලබාදෙනු ලැබේ.)

| *ලබා ඇති ප්‍රශංසාව* | *ප්‍රශංසාව ලැබුනේ* | | *කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් වෙනුවෙන් ප්‍රශංසාව හිමිවූයේ ද යන්න* |
|---|---|---|---|
| | *කාගෙන් ද යන්න* | *වර්ෂය* | |
| | | | |

*(ආ)* ලබා ඇති සම්මාන පිළිබඳ විස්තර.-

(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි B. iii ඡේදයේ ඇතුළත් වගුවේ වර්ග කර ඇති ආකාරය පදනම් කර ගෙන පහත වගුවේ සඳහන් කරන්න.)

1. කෘෂිකාර්මික අංශය වෙත දක්වූ දායකත්වය සඳහා අන්තර්ජාතික මට්ටමේ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | *සම්මානය පිරිනමන ලද්දේ* | | *කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් වෙනුවෙන් සම්මානය ලැබුනේ ද යන්න* |
|---|---|---|---|
| | *කවුරුන් විසින් ද යන්න* | *වර්ෂය* | |
| | | | |

2. කෘෂිකාර්මික අංශය වෙත දක්වූ දායකත්වය සඳහා ජාතික මට්ටමේ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | සම්මානය පිරිනමන ලද්දේ | | කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් වෙනුවෙන් සම්මානය ලැබුනේ ද යන්න |
|---|---|---|---|
| | කවුරුන් විසින් ද යන්න | වර්ෂය | |
| | | | |

3. කෘෂිකාර්මික අංශය වෙත දක්වූ දායකත්වය සඳහා පළාත් මට්ටමේ විශේෂ සම්මාන - ඇත/නැත

| සම්මානයේ නම | සම්මානය පිරිනමන ලද්දේ | | කුමන ක්ෂේත්‍රයට අදාළ කාර්යයන් වෙනුවෙන් සම්මානය ලැබුනේ ද යන්න |
|---|---|---|---|
| | කවුරුන් විසින් ද යන්න | වර්ෂය | |
| | | | |

(i) මට විරුද්ධව දැනට විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ සඳහන් I හෝ II වන උපලේඛනය යටතේ සිදුකරනු ලැබූ වරදකට දඬුවම් නොලැබූ අයෙකු බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා බවත් මෙයින් සහතික කරමි.

.......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ............................................................ නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම නිලධාරියා/නිලධාරිනිය විසින් 2023.07.14 දිනට පූර්වාසන්න පස් වසරක කාලසීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. නිලධාරියා/නිලධාරිනිය තෝරාගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

..........................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
නම,
නිල මුද්‍රාව.

දිනය :............................

අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :

උක්ත අයදුම්පත්‍රය මා විසින් නිර්දේශ කරමි/නොකරමි.

.........................................................................,
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.
නම
නිල මුද්‍රාව

දිනය :.............................

පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : (පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සඳහා පමණි)

උක්ත අයැදුම්පත්‍රය මා විසින් නිර්දේශ කරමි/නොකරමි.

.........................................................................,
පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන.
නම
නිල මුද්‍රාව.

දිනය :.............................

06-489

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.